# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2010/23 - 2017 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1964 අංක 29 ජල සම්පත් මණ්ඩල පනත**

16 වගන්තිය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගාමිණි විජිත් විජයමුණි සොයිසා වන මා හට 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතෙහි (සංශෝධිත 1999 අංක 42 දරන පනත) 16 වගන්තිය ප්‍රකාරව හිමිව තිබෙන්නාවූ බලතල අනුව ජල සම්පත් මණ්ඩල නියෝග මින් ප්‍රකාශයට පත් කරමි.

ගාමිණි විජිත් විජයමුණි සොයිසා,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය.

2017 මාර්තු මස 15 වැනි දින,
කොළඹ,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ දී ය.

**1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 12(1) වගන්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් එකී පනතේ 16(1) හා 16(2) වගන්තිය යටතේ ක්‍රියාත්මක නියෝග**

(1) මොනයම් රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ පුද්ගලයකු මින් ඉදිරියට පහත සඳහන් කාර්යයන් හෝ ව්‍යාපෘතීන් සඳහා, ස්වාභාවික ජල උල්පතක් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරනු ලබන්නේ නම්,

එම කාර්යයේ හෝ ව්‍යාපෘතියේ සම්පූර්ණ තොරතුරු ඇතුළත් කළ ව්‍යාපෘති යෝජනාව, ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු අතර ජල සම්පත් මණ්ඩලය විසින් දෙනු ලබන නියමයන්ට අනුකූලව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු ය.

එකී කාර්යය හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ජල සම්පත් මණ්ඩලයේ නිසි ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

එනම්,

(අ) කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විෂ්කම්භය මීටර් 4ක් හෝ ඊට වැඩි වගා ළිං ;

(ආ) වාණිජමය කෘෂිකාර්මික කටයුතු හා කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදිකරනු ලබන නිෂ්පාදන නල ළිං හා වල ළිං හෝ ස්වාභාවික ජල උල්පත්, නිෂ්පාදන නල ළිං, වල ළිං, යොදාගනිමින් කරනු ලබන වාණිජමය, කෘෂිකාර්මික කටයුත්තක් ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කර්මාන්තයක් (ඇමුණුම 01).

(2) නල ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය.


1A - G 25277 — 27 (2017/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නල ළිං ඉදිකිරීම ජල සම්පත් මණ්ඩලය විසින් ලබා දෙනු ලබන උපදෙස් අනුව සිදු කළ යුතු අතර පරිසරයට හානි නොවන පරිදි එයින් ලබා ගත හැකි ජල ප්‍රමාණයන් නිවැරදි ලෙස තක්සේරු කිරීම ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකර ඊට අදාළ අනුමැතිය ලබා ගත යුතු ය. ඒ අනුව දිනකදී ලබාගන්නා ජල ප්‍රමාණය මැනීම සඳහා අදාළ ආයතනය විසින්ම ජල මනු (flow meter) සවිකිරීම සිදු කළ යුතු අතර දෛනිකව ලබා ගන්නා ජල ප්‍රමාණයන් පිළිබඳ දත්තයන් නඩත්තු කිරීම කළ යුතු ය. අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂා කිරීම සඳහා මෙය ඉදිරිපත් කිරීමට අදාළ ආයතනය බැඳී සිටී.

ඉහත ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් සිදු කරනු ලබන්නේ නම් එසේ ඉදිකරනු ලබන සියලු ගැඹුරු හෝ නොගැඹුරු නල ළිං පිළිබඳ පහත දක්වෙන දත්තයන් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදිය යුතු ය. (ඇමුණුම 02, ඇමුණුම 03)

ජල සම්පත් මණ්ඩලය විසින් මෙම දත්තයන් මණ්ඩලයේ දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලබන අතර ඒවා භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා ද ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරණය සඳහා ද භාවිතා කෙරේ.

(3) ජලය බෝතල කිරීමේ කාර්මාන්තයෙහි, බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ පුද්ගලයකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගි කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 06 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් (ඇමුණුම 04) මගින් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත යොමු කළ යුතු ය.

(4) වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා (ඇමුණුම 05) මසකට ලීටර් 30000 ක භූගත ජලය ලබාගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබාගත යුතු වේ.

(5) ස්වාභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන හෝ සේවා කටයුතු සිදුකරනු ලබන ආයතන හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානවලට ඇතුලු වී පරීක්ෂා කිරීමේ අයිතිය ජල සම්පත් මණ්ඩලය සතු ය.

(6) ඉහත ඡේදයන්හි විස්තර කර ඇති පරිදි කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන හා සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් ක්‍රියා කරනු ඇත.

*ඇමුණුම 01*

**ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගි කරගනිමින් කරනු ලබන කර්මාන්ත වන්නේ**

01. පානීය ජල බෝතල් කර්මාන්තය
02. වෙනත් බීම නිෂ්පාදන කර්මාන්ත
03. රෙදි සෝදන ස්ථාන
04. වාහන සේවා ස්ථාන
05. හෝටල් කර්මාන්තය
06. පැල තවාන්
07. කෘෂිකාර්මික ගොවිපළ
08. සත්ව පාලන ගොවිපළ
09. පෞද්ගලික මට්ටමින් ජලය විකුණනු ලබන ස්ථාන
10. කොහු සහ රබර් ආශ්‍රිත කර්මාන්තශාලා
11. අයිස් කර්මාන්ත ශාලා
12. ජල සම්පත් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් කර්මාන්ත

*ඇමුණුම 02*

**ගැඹුරු හා නොගැඹුරු නළ ළිංවලට අදාළ දත්තයන් වනුයේ**

01. ළිඳ පිහිටි ස්ථානය : GPS ඛණ්ඩාංක
02. භූ භෞතික විද්‍යාත්මක දත්ත
03. ළිඳේ විෂ්කම්භය
04. ළිඳේ ගැඹුර
05. ළිඳේ පස් හා පාෂාණ සම්බන්ධ ලොග් වාර්තා
06. ළිඳේ විදුම් වාර්තාව
07. ළිඳේ ජල මට්ටම
08. ළිඳේ පොම්ප පරීක්ෂණ වාර්තාව
09. ළිං ජලයේ ගුණාත්මකතාව සම්බන්ධ වාර්තා (භෞතික, රසායනික, බැක්ටීරියා, ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ පරීක්ෂාවන් ඇතුළත්ව)
10. ළිඳේ පාෂාණවල පිහිටි කුස්තුරවලට අදාළ විස්තර

*ඇමුණුම 03*

**කෘෂි වගා ළිංවලට අදාළ දත්තයන් වනුයේ**

01. ළිඳ පිහිටි ස්ථානය
02. භූ භෞතික විද්‍යාත්මක දත්ත
03. ළිඳේ විෂ්කම්භය
04. ළිඳේ ගැඹුර
05. තද පාෂාණය දක්වා හාරා ඇත්ද යන බව
06. ළිඳේ ජල මට්ටම
07. ළිඳේ පොම්ප පරීක්ෂණ වාර්තාව
08. ළිං ජලයේ ගුණාත්මකතාව සම්බන්ධ වාර්තා

*ඇමුණුම 04*

**රජයේ පිළිගත් රසායනාගාර**

01. කාර්මික තාක්ෂණික ආයතනය
02. ජල සම්පත් මණ්ඩලය
03. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
04. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
05. භූ විද්‍යා හා පතල් කාර්යාංශය
06. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

*ඇමුණුම 05*

ඇමුණුම 01 න් දක්වා ඇති සියලුම කර්මාන්ත අයත් වේ.

03 - 1241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.